


# සර්කස් එකේ විකටයා



සර්කස් කණ්ඩායමකට නැතිවම බැරි චරිතයක් වනුයේ විකටයා ය. එහෙත් ඔහු බොහෝ තැනක දක්නට ලැබෙන මෝඩ තකතිරුවා නොවේ. ඔහු ද හැම සර්කස්කාරයකු ම කරන පිනුම් කරනම් ගැසීමේ හැකියාවක් සහිත තවත් සර්කස් ශිල්පියෙක්ම ය. ලොමු දැහැ ගන්වන දර්ශන නරඹමින් සිටින ප්‍රේක්ෂකයා තුළ සැහැල්ලුවක් ඇති කොට ඔහු හෝ ඇය සිනා ගස්සන එකෙන් සර්කස් දර්ශනයේ අගය වැඩි කිරීමට යොදා ගන්නා ලද නුවණට හුරු අමතර අංගයක් නොහොත් චරිතයක් වශයෙන් විකටයාට විශේෂ ස්ථානයක් හිමිවන්නේ ඒ නිසා ය.

විකටයා මේ කියන සර්කස් මඩුවෙන් පිටතට පැමැණි - හරියටම කියතොත් අරන් ආපු - අවස්ථාවක් 1972 දී හෝ 1973 දී ශ්‍රී ලංකාවේ බොහෝ දෙනාගේ කතා බහට ලක්විය.

ඩේලිනිව්ස් පත්තරයේ මුල් පිටුවේ පළ වන දවසේ අනාවරණය යටතේ ද පළකිරීමෙන් එහි වැදගැම්ම තවත් වැඩි විය.

සිද්දියට පසුබිම පැහැදිලි කිරීම අවශ්‍යමය. 1971 ජ.වි.පෙ. කැරැල්ලට පසු තුල්හිරියේ පෙහෙකම්හල තිබුණේ යකුන් නටාපු පිටියක් වාගේ ය. යන්ත්‍ර සූත්‍ර පමණක් නොව මිනිස් සම්පතද පිරිහී ගොස් නිෂ්පාදනය ඇන හිට තිබුණේ ය. කම්හල යථා තත්වයට පත් කිරීමට සාමාන්‍ය පාලකයකු - කළමනාකරුවකු - සමත් නොවන බව ඇමතිතුමාට පැහැදිලි ය. කර්මාන්ත ඇමති ටී බී සුබසිංහ ඒ අසීරු රාජකාරියට තෝරා ගත්තේ ලන්ඩනයේ සිටියදී තමාගේ අනුග්‍රාහකයකු ද වූ හිතමිතුරු ජෝ සිල්වා නැමැත්තෙකි. පුද්ගලික අංශයක සේවය කරමින් සිටි ජෝ සිල්වා නාහෙට නාහන පුද්ලයකු වුව ද මෙබඳු වැඩකට කියාපු පුද්ගලයා බව ඇමතිතුමාත් තවත් නිලධාරී කිහිප දෙනෙකුත් තීරණය කළ හ.

ජෝ සිල්වා කළමනාකරණ භාෂාවේ මානව හිතවාදී ආඥාදායකයා යනුවෙන් හැඳින්වෙන ශෛලිය අනුගමනය කරන්නෙකි. අණ දීමට මිසක් අණ පිළිපැදීමට පුරුදු නැති ඔහුට පේෂකර්ම සංස්ථාව තුළ ඉහළ නිලධාරීන්ගේ ඇඟිලි ගැසීමකින් තොරව කටයුතු කිරීමේ නිදහස අවශ්‍ය විය. තුල්හිරියේ සාමාන්‍යාධිකාරි වශයෙන් නව තනතුරක් ඇති කොට ජෝ සිල්වා ඒ තනතුරට පත්කරන ලද්දේ ඒ නිසා ය. ඒ තත්වය සංස්ථා සභාපතිට ද දන්වන ලදී .

එහෙම වුණාට ලොක්කන්ට තමන්ගේ බලතල පෙන්වීමේ පුරුද්ද අත්හරින එක අමාරුය. පුරුදු පරිදි තමා යවන නියෝගයක් තුල්හිරියේ සාමාන්‍යාධිකාරිටද යැවීමට ඔහු තීරණය කළේ ඒ නිසා ය.

ජෝ සිල්වා එම නියෝගයට දැක්වූ ප්‍රතිචාරය නිසා ය යට කී ඩේලිනිව්ස් කොලම සහ කට කතා පැතිරෙන්නට වූයේ.

මේ විස්තරය කීවේ අද ශ්‍රී ලංකාවේ තත්වය ගැන කතා කරන්නට ය. ජනාධිපති මහින්ද රාජපක්ෂ ගේ ප්‍රතිපත්ති හා තීරණ අනුව දශක තුනක් පුරා පැවති ව්‍යසනයකින් රට මුදවා ගනු ලැබී ය. එක අතකින් 1971 ජවිපෙ පෙරළියෙන් පසු තුල්හිරිය පත්වූ තත්වයට රට ද පත්ව තිබුණේ ය. සුරක්ෂිතතාව පිළිබඳ සහතිකයක් ජනතාවට දෙන අතර අතපහුව තිබුණු සංවර්ධන නටයුතු පටන් ගැනීම අවශ්‍ය විය. ඒ පැත්ත නම් එක්තරා ප්‍රමාණයකට සිදුවන බව පිළිගත යුතු ය. එහෙත් ජෝ සිල්වා විසින් තුල්හිරියට උදා කළ ශික්ෂණය හා සාර්ථක ක්‍රියාකාරීත්වය තවම ඇති වූ පාටක් නැත .

ජෝ සිල්වා යටතේ සේවකයන් බඳවා ගැනීමේ දී දක්නට ලැබුණ විකට ජවනිකාවක් ද සිහිපත් කළ යුතු ය. අත්තනගල්ලේ තරුණයෙක් රෙකමදාරු ලිපියක් ද රැගෙන ජෝ සිල්වා වෙත පැමිණ එය ඔහු අතට දුන්නේ ය.

"කාගෙන්ද මේ ලියමන?"
"අනුර හාමුගෙන්"

ජෝ සිල්වා ලිපිය කියවූයේ නැත . පැත්තකට විසි කළේ මෙහෙම කියමින් ය.

"මං ඔය කලිසමේ හුජ්ජ කරගන්නා කොල්ලන්ගේ ලියුම් ගණන් ගන්නේ නැහැ"

ඒ මැතිණියගේ ආණ්ඩුව යටතේ ය. ජෝ සිල්වා ට තරවටුවක් පවා ආවේ නැත.

අර සභාපතිගේ නියෝගය ලැබුණ විගස ද ජෝ සිල්වා නොපමාව ප්‍රතිචාර දැක්වී ය. ඒ නියෝගය සහිත කඩදාසියේ ම යටින් පැහැදිලි අකුරෙන් වගන්තියක් ලියා ආපසු සංස්ථා සභාපති වෙත යැවීය. වගන්තිය මෙයයි.

"මේක සර්කස් එකක් නොවෙයි. එහෙම වුණාත් ඔබ වාගේ විකටයෙක් මෙතනට අවශ්‍ය නැත."

අද ශ්‍රී ලංකාවේ රජයේ ආයතනයකින් වැඩක් කරවා ගැනීම කොයි තරම් අපහසුදැයි මගේ වයසේ අය පමණක් නොව තරුණ තරුණියෝ ද අත්දැකීමෙන් දනිති. රටේ සිටියදී කන්තෝරුවකට ගිය හැම වතාවකම වාගේ මා ඒ අමාරුව අත්නොදැක්කේ හැම තැනකම වාගේ මගේ සගයකු නොහොත් ගෝලයකු වගකිවයුතු තැනක සිටි නිසාය.

එහෙත් අප රජයේ ආයතනයකට යන්නේ නෑදෑ මිතුරන් බලන්නට නොවේ. රජයේ - එනම් බදු ගෙවන්නන්ගේ - මුදලින් වැටුප් ලබන සේවකයන් අතින් වැඩක් කරවා ගන්නා පිණිසය. එසේ කර ගන්නට කිසිවකුට වැඳ වැටෙන්නට වුවමනා නැත.

අද තත්වය පරණ රටාවෙන් ඈත්ව නැත. ආයතන බොහොමයක සේවය කරන නිලධාරීන් දවසකට පැය දෙකක් තුනක් වත් අවංකව වැඩ කරනවා නම් සමස්ත රාජ්‍ය සේවයම ඇදහිය නොහැකි තරමේ ප්‍රගතියක් දක්වනු නිසැක ය. කෙසේ හෝ එය සිදුවන පාටක් නැත .

අප වැන්නන් පිට රට සිට පවා පත පතා සිටියේ ත්‍රස්තවාදය හමාර කළ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා මේ ටිකත් ඉටු කරනවා ඇත කියා ය. ඒ සඳහා නායකත්වය දීමේ ශක්තිය අදත් ඔහු සතුව ඇති බව කිව යුතුය.

රජයේ සේවකයා තුළ ආත්ම විශ්වාසයක් සහ සේවයට ලැදියාවක් - කැපවීමක් - ජනිත කරලීම අවශ්‍ය ය. නැතුවම බැරි දෙයකි. එසේ කරන්නට නම් ඔහුට හා ඇයට ආදර්ශයක් හා පිළිගැනීමක් දිය යුතු ය.

ආදර්ශය දිය යුත්තේ පාලනයේ හා රජයේ නායකයන්ගෙන් ය. එබන්දන් රට ගැන - රටේ දියුණුව ගැන - කිසිම තැකීමක් නැතිව තමන්ගේ මඩිය තර කර ගැනීමට යොමු වූ කල ඔවුන් දෙන අණ හා උපදෙස් කකුළුවා ගේ අනුසාසනාවට නොදෙවැනි ය.

ආදර්ශයක් දීමට හෝ උපදෙසක් තියා අණක් දෙන්නටවත් සුදුසුකමක් නැති පරාජිකා වුණු මැති ඇමතිවරුන් පසුගිය මැතිවරණයේදී ඡන්ද දායකයා විසින් පිටමං කරනු ඇතැයි අපි බලා සිටියෙමු. එකකු දෙන්නකු ගිගිහී වැටුණත් තවත් පිරිසක් ජනතා වරම ලබා ගත්හ. ඒ පිරිසට අයත් වූවෙක් ආචාර්ය මර්වින් සිල්වා නමින් හඳුන්වනු ලබන්නෙකි.

වත්මන් රජය සර්කස් එකක් යයි කිව හොත් එතැනට රිංගා ගත් නොගැළපෙන විකටයා වනුයේ යට කී මර්වින් සිල්වා ය.

කිසිදාක මහජන ඡන්දයෙන් පාර්ලිමේන්තු ආසනයක් දිනා ගන්නට බැරුව සිටි ඔහු සැලකිය යුතු බහුතරයකින් පෙරට ගන්නට ගම්පහ ජනතාව තීරණය කළ හ. හේතුව කවරක් වුව ද ජනතා තීරණයට ගරු කිරීම ප්‍රජාතන්ත්‍රවාදය යටතේ විය යුත්තක් හෙයින් ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පිළිගැනීම එකකි. පනින රිලවාට ඉණි මං බැඳ දීම ඊට වඩා වෙනස් ක්‍රියාවකි.

මර්වින් සිල්වා විකටයා යයි කීවත් සර්කස් එකේ විකටයාට වාගේ සර්කස් කරුවන් කරන හපන්කම් කරන්නට ඔහුට හැකියාවක් ඇද්ද යන ප්‍රශ්නය නම් නැගිය යුතු ය.

ඒ ප්‍රශ්නයත් ව්‍යාකූල කරමින් ඉන් මතු වන සුදුසුකම් දෙකක් ඔහුට ඇත . එකක් පරම්පරාවය. එය ශ්‍රී ලංකා දේශපාලනයේ සේනානායක බණ්ඩාරනායක හෝ රාජපක්ෂ පරම්පරාවට වඩා ජනතා ගෞරවයට පාත්‍ර වූවකි. මර්වින් සිල්වා දුටුගැමුණු පරපුරට අයත් වූවෙකි.

1949 වර්ෂයේ පළ කරන ලද -සමාජ සංදර්ශනය" නම් වූ පොතක් එවක ඉමහත් ආන්දෝලනයකට තුඩු දුන් බව කිහිප දෙනෙකුට වත් මතක ඇතැයි සිතමි. ලේඛකයා ඩී ආර් ජයවර්ධන ය. -අපේ කලා ශිල්ප හා සාහිත්‍යය" නමින් ද අගනා පොතක් ඔහු විසින් රචනා කරන ලදී . සමාජ සන්දර්ශනයේ -කුරුඳුවත්ත" යන හිසින් එන ලිපිය අද පවා ආසාවෙන් කියවා රස විඳිය හැකි අනාවරණ සහිත වූවකි. කුරුඳුවත්තට රිංගාගත් අලුත් සල්ලිකාරයන් සමාජයේ පිළිගැනීමක් ලබා ගනු පිණිස පංචිකාවත්තේ වාසය කරන සිවුරු හළ ප්‍රාචීන පණ්ඩිතයන්ගේ පිහිට ලබා ගන්නා ආකාරය සවිස්තරව ඉදිරිපත් කිරීමට ජයවර්ධන සමත් වෙයි.

අනුරාධපුර සමයේ සූර්යවංශික රජ කුමරකුගෙන් අපේ පවුල ආරම්භ වුණු බව සාධක සහිතව ලියන ලෙස අර පඬිතුමාට ආරාධනා කරන්නේ කුරුඳුවත්තේ අලුත් සල්ලිකාරයකු ගේ බිරියයි.

ඉල්ලීම ඉටු වෙයි. පරණ සන්නසක් අනාවරණය කර ගැනීමට නොහොත් නිර්මාණය කිරීමට ද පඬිවරයා සමත් වෙයි. අර පොත කියවපු කාට වුණත් දුටු ගැමුණු පරපුර තබා විජය පරපුර වුවත් පුදුමයක් නොවනු ඇත .

ඊළඟට ආචාර්ය උපාධිය? මා දන්නා මෙල්බර්න් වාසිකයෙක් මෑතක මට රහසක් කීවේ ය. ඒ තමාටත් ආචාර්ය උපාධියක් ලැබී ඇති බව ය. කාටවත් නොකියා එය රහසක් වශයෙන් තබා ගන්නා බවත් අවධාරණය කළ ඒ පුද්ගලයා එංගලන්තයේදී උපයා ගත් උපාධියක් සහ මෙරටදී උපයා ගත් දෙවැනි උපාධියක් ද හිමි උගතෙකි. එහෙත් තමා ලියූ රචනාවක් පදනම් කොට පිරිනමන ලද ආචාර්ය උපාධියට තමා නුසුදුසු බවය, ඔහු කල්පනා කරන්නේ.

ශ්‍රී ලංකාවේ ආචාර්ය උපාධිලාභීන් දෙවර්ගයක් ඇත. අධ්‍යාපන සුදුසුකම් මත උපයා ගත් උපාධිය ඇත්තන් එක පැත්තකට දැමූ විට ඉතිරිවන දෙවන කොටස සම්මාන ආචාර්ය උපාධි ලාභීහු ය. ඔවුන් අතුරෙන් ද නියම පිනාචාරීන්ගේ ගණයට වැටෙන කොටසක් ඇත . ඒ රටට - සමාජයට හෝ භාෂා ශාස්ත්‍ර වෙනුවෙන් මෙලෝ සේවයක් නොකළ නිකම්මු ය.

මර්වින් සිල්වා ට සුදුසු ගණය තීරණය කිරීම කෙසේ වුවත් අපට කළ හැක්කේ එබඳු ගෞරවයක් දීමට තරම් මුහුකුරා ගිය නුවණක් තිබුණු ආයතනය නොහොත් පුද්ගලයා වෙනම උපාධියකට හිමිකම් පාන බව පමණක් කීම සෑහෙයි.

සමෘද්ධි නිලධාරියකු ගස් බැන්දා යයි කියන මර්වින් සිල්වා මෑත දී කියා තිබුණු කතා තුනක් සටහන් කළ යුතු ය. එකක් තමාට සෙනසුරු ඒරාෂ්ටකය නිසා කරදර ඇති වූ බව ය. ඒ ගැන කිව යුත්තේ එහෙම වෙලාවට සෙනසුරාට දිය යුතු දඬුවමක් ඇද්ද යන්නයි.

තමා නිවන් දකින්නේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා බුදු වෙන කොට යයි කීම දෙවැනි ප්‍රකාශයයි. තුන් වැන්න තමා බැසිල් රාජපක්ෂ මහතාගේ අග්‍ර ශ්‍රාවකයකු බව කීම ය.

ශ්‍රී ලංකාව බඳු බෞද්ධ දේශයක ජනතා නියෝජිතයන් කතා කළ යුත්තේ - ක්‍රියා කළ යුත්තේ - මේ වාගේ බම්මන්නන් විදියට නොවේ. බම්මන්නාට වුවත් නිසි වේදිකාවක ඉටු කළ හැකි රාජකාරියක් - මෙහෙවරක් ඇත. එය වගකිවයුතු දේශපාලකයකු ගෙන් අපේක්ෂා කළ හැක්කක් නොවේ.
ඉහත සඳහන් කළ ආකාරයට අද දේශයට අවශ්‍ය වනුයේ අවංක වූත් - කාර්යක්ෂම වූත් - රාජ්‍ය සේවයකි - රජයේ සේවක පරම්පරාවකි.

ඔවුන්ට මනුෂ්‍යයන් වශයෙන් - පුද්ගලයන් හැටියට - ගරු කළ හැකි - ගරු කිරීමට සැරසුණ හා සමත් නායකයන් පිළිබඳ අවශ්‍යතාවක් හා උග්‍ර හිඟයක් පවතින සමයක අර වාගේ විකටයන් වේදිකාවට ගෙන ඒම සමස්ත සමාජයම උඩුකුරු යටිකුරු කරන විකාරයකි.

ඒ නිසා අපට දුර සිට පැතිය හැක්කේ තාවකාලික වශයෙන් ඉවතට දමා ඇති විකටයා යළිත් වේදිකාවට අරගෙන ජාතික රංගනය නොහොත් ජාතික අභිවෘද්ධිය උදෙසා ඉටු කළ යුතු කාර්යභාරය අඩ පණ නොකරනු ඇතැයි පැතීම පමණි. ■

## කර්තෘ සටහන

*මේ ලිපිය පළ වන දිනය වන විට කුරුප්පු මහතා කියන විකටයාගේ භූමිකාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් වරයා විසින් මර්වින් වෙතින් බලහත්කාරයෙන් උදුරා ගනු ලැබ ඇත. ඔහු කියන්නේ මර්වින් රජයේ නිලධාරියකු ගස් බැඳීමේ සිදුවීම මර්වින් සහ ඒ නිලධාරියා විසින් කලින් කතා බහ කොට සිදු කළ රංගනයක් බව ඔප්පු වී ඇති බැවින් මර්වින් සිල්වා මහතා සකළවිධ චෝදනා වලින් නිදොස් කොට නිදහස් කළ බව ය.*